සකල කලාවම තුළ ඇති ජනප්‍රියම මාධ්‍යය -ගීතය" යැයි කිව-හොත් එයට කිසිඳු විවාදයක් ඇතැයි නොසිතෙන තරමට අද ගීතය ජනප්‍රිය කලා මාධ්‍යයක් බවට පත්ව ඇත. රූපවාහිනී මාධ්‍යයට මේ ජනප්‍රිය ගීතය පැමිණීමත් සමඟ එයට එක්වූ නර්තනයටද ඉහළ ජනප්‍රියත්වයක් ලැබිණි.

ඉඳින්, මේ ගීතය නමැති කලා මාධ්‍යයට යොදා ගන්නා නර්තනය, ගීතයේ සැබෑ රස වින්දනයට කොතරම් ගෝචර වන්නේද? බොහෝ ශිල්පීන් මේ පිළිබඳ විවිධ මත පළ කරති. මෙය මූලික කර අපේ ප්‍රවීණ රංගන ශිල්පී චන්න විජේවර්ධනයන් සමඟ කතිකාවක යෙදුනෙමු.






## විවිධ නර්තන කණ්ඩායම් මගේ ශෛලිය අනුකරණය කරනවා

### ප්‍රවීණ නර්තන ශිල්පී චන්න විජේවර්ධන

**** දෘෂ්‍ය මාධ්‍යයේ ප්‍රවිෂ්ඨයත් සමඟ ගීතයට එක්කළ රංගනය, ගීතයේ සැබෑ රස වින්දනයට බාධාවක් හැටියට බොහෝ පිරිස් දකිනවා. මේ පිළිබඳ ඔබේ විනිශ්චය කොයි වගේද?***

මෙය සම්පූර්ණ සත්‍යය නොවේ. ගීතයකට නර්තනයක් වුවමනා වෙන්නේ දෘෂ්‍ය මාධ්‍යයේ දී ගායකයා තිරයෙන් ඉවත් වුණාම. ඒ හිඩැස පුරවන්නේ රූප දර්ශනයක් වෙන්න පුළුවන්. මේ නර්තනය ගීතයේ රිද්මය අනුව වෙන්නත් පුළුවන්. ගීතයේ සංගීතය අනුව වෙන්නත් පුළුවන්. කෙසේ හෝ වේවා ඒ රංගනය සමස්ත ගීතයටම ආලෝකයක් වෙන්නට ඕනෑ. මෙය හරියට දැනගෙන කරන නර්තන නිර්මාණයකට ඔය චෝදනාව කරන්න බැහැ. අනෙක ගීතයට එකතු කරන නර්තනය පෙන්වන්නේ කාටද? පළාත රට මොකක්ද? මේ දේ අනුවත් ප්‍රේක්ෂකයා තේරුම් ගැනීමේ විධිය වෙනස්. මේ නිසා මේ මූලික සිද්ධාන්තවලින් තොරව ගීතයකට නර්තනයක් නිර්මාණය කරනවා නම් ඇත්තටම ඒක ගීතයකට කරන විශාල හානියක්.

**** ඔබට මෙතෙක් ඔය චෝදනාව එල්ල කරලා නැද්ද?***

සත්‍ය වශයෙන්ම නැහැ. මගෙන් මේ රටේ ප්‍රවීණයන් වගේම නවකයන් ඉල්ලීම් කරනවා මගේ ගීතයටත් නර්තන නිර්මාණයක් කරන්න කියලා. මම ඒ දේ කරලත් තියෙනවා.

**** එහෙම නම් කාටද මේ චෝදනාවන් කරන්නේ?***

අපේ ශිල්පීන් ඉන්නවා එක දවසක් දෙකක් පන්තියකට ගිහින් නැටුමක් කරන අඩි ටිකක් බලාගෙන පන්ති කරන අය. මේ නිසා ඔබ චෝදනාව ඒ අයට කරන එක සාධාරණයි. කවදාවත් බැහැ නිරන්තර පුහුණුවක් නැතිව බලාගෙන ඉඳලා මේ දේ කරන්න. අද රටේ හැම තැනම පන්ති තියෙනවා. කොහේ හරි ප්‍රසංගයක් තිබ්බම සිංදුවකට ඔහේ නටනවා. ගීතයේ අරුතට සංගීතයට කිසිම ගැලපීමක් නැහැ. රිද්මයක වුණත් කලාත්මක බවක් තියෙන්න ඕනෑ. අත පය විසි කරනවා මිස කොහෙද ඒවායේ ලාලිත්‍යයක් තියෙන්නෙ. අන්දවන ඇඳුම් බලන්න. ආලෝකකරණය බලන්න. මේවායේ නිසි ගැලපීමක් නැහැ. මම නර්තන ශිල්පියෙක් වුණේ හොඳ චිත්‍ර ශිල්පියෙක් වෙලා. රංගන ශිල්පියාට අන්ද-වන ඇඳුම් ඔහුගේ හැඩතල පවා මට චිත්‍රයට නගන්න පුළුවන්. වර්ණ සංකලනය, ආලෝකය, මේ හැම දෙයක්ම මට කරන්න පුළුවන්. කවුරු හෝ වේවා හොඳ නර්ථන ශිල්පියකුට චිත්‍ර කලාප පිළිබඳ හොඳ අවබෝධයක් තියෙන්න ඕනෑ. එහෙම නැතිව නර්තනයකට උචිත ඇඳුම් නිර්මාණ, නිසි ඉරියව් යොදා ගන්න බැහැ. මේ දේවල් මම බොහෝ විට අධ්‍යයනය කළේ අපේ පන්සල් චිත්‍ර හා දේව රූපවල අංග ඇසුරු කරගෙන.

**** රූපවාහිනී සංගීත වැඩසටහන් ඇසුරෙහි එකම ගීතයට එකකට එකක් වෙනස් නිර්මාණත් දකින්න තියෙනවනෙ?***

එහෙම වෙන්නේ ඒ සංගීත වැඩස-ටහනෙහි ආකෘතියට අනුවනේ. නඳුන් උයන කියන්නෙත්, මනෝහාරී කියන්නෙත්, නර්තන ප්‍රසංගයක් කියන්නේත් අවස්ථාවන් 3 ක්. ඒ ඒ වැඩසටහනට අනුව නිර්මාණයන් වෙනස් කරන්න වෙනවා. හැබැයි ගීතයක නම් රිද්මය ගීතයේ අදහස සංගීතය මේවායින් කිසි විටෙකත් බැහැර වෙන්න බැහැ.

**** ඔබ වැඩිපුර උත්සාහ ගන්නේ නර්තනයේදී නාඹර තරුණියන්ගේ අඟ පසඟ ප්‍රදර්ශනයෙන් ශෘංගාරය ඉස්මතු කරන්න කියලයි බො***හෝදෙනා කියන්නෙ?

ඉතින් කාන්තාවකගේ සිරුරින් ශෘංගාරය ඉස්මතු කරනවා හැරෙන්නට වෙන මො-නවද ඉස්මතු කරන්න තියෙන්නෙ. එහි ඇඳුම් නිර්මාණය, සිරුරේ හැඩය, හමේ වර්ණය පවා ඉස්මතු කරන්නේ ඒ අරමුණ ඇතිව තමයි. වැඩි ප්‍රේක්ෂක ආකර්ශණයක් ඉන් ඇති කරන්න පුළුවන්. ප්‍රේක්ෂකයාට පිළිකුලක් ඇතිවන රංගනයකට කොහෙ-ාමද ආකර්ෂණයක් ඇති වෙන්නේ.

* හැමදාම දකින්නේ ඔබගේ නර්තනයන්ට තෝරාගත් එකම පිරිසක්. ඇයි වෙනත් අයට ඔබගේ කණ්ඩායමේ ඉඩක් නැත්තේ?

වෙනත් අය මා සමඟ ඉන්න කණ්ඩායමේ අය තරම් දක්ෂ නැති නිසා. මගේ ඕනෑම ශිෂ්‍යයෙකුට තමන්ගේ දක්ෂතා පෙන්වලා මගේ කණ්ඩායමේ අය පරද්දන්න පුළුවන් නම් ඒ අයට එතනට එන්න පුළුවන්. ඔවුන් කණ්ඩායමට ඇතුළත් කරගෙන ඉන්නෙ දක්ෂතා මත පමණයි. ඉන් පිට කිසිම භාහිර බලපෑමක් නැහැ.

**** මේ දක්ෂතා පවත්වාගෙන යන්න ඔවුන් මොනවද කරන්නෙ?***

නිරන්තර පුහුණුවීම්. දිනකට පැය 4 ක් ව්‍යායාම්වල යෙදෙනවා. ඔවුන්ගේ සිසුන්ට පන්ති පවත්වනවා. මාගේ නිර්මාණයන්ට දායක වෙන හැම කෙනෙකුගේම උපරිම කැපවීමක් තියෙනවා.

**** ඔබ කිසියම් නර්තන සම්ප්‍රදායක් ගොඩ නැගූ ශිල්පියෙක්ද?***

නැහැ. මම සම්ප්‍රදායක් ගොඩ නැගුවේ නැහැ. සම්ප්‍රදායන් හොඳින් ප්‍රගුණ කළා. ඒ ඔස්සේ මම අලුත් ශෛලියයක් ගොඩ නැගුවා. නමුත් අපේ මූලික සම්ප්‍රදායික නැටුම් ප්‍රගුණ කරන්නෙ නැතිව අපට බැහැ කවදාවත් අලුත් ශෛලියක් ගොඩ නගන්න. මා මේ දේ කරන්නෙ නිරන්තර හැදෑරීමෙ-න්. ප්‍රගුණ කිරීමෙන් නමුත් විවිධ නර්තන කණ්ඩායම් මම දකිනවා රංගනයේ යෙදෙනවා. ඒ හැම නර්තනයකම තියෙන්නෙ මගේ ශෛලිය අනුකරණය කිරීමක්. ඒක සුදුසු නැහැ. තමාගේම ශෛලියක් ගොඩනගා ගන්නවා නම් මටත් හරි ආසයි එහෙම කෙනෙක්ගෙ නර්තනයක් බලන්න.

**** රූපවාහිනී තිරය තුළින් අපි දකින නර්තනයේ සියලු අංග එකවිට ග්‍රහණය කර ගන්න බැහැනෙ. ඒක නිසා උත්සාහයේ හිතන තරම් ප්‍රතිඵල ලැබෙන්නෙ නැහැ කියලත් කෙනෙකුට හිතෙන්න පුළුවන් ?***

රූපවාහිනියෙන් අපේ නර්තනයක සියයට දහයකවත් දෙයක් දැක ගන්න බැහැ. තමන්ගේ පියවි ඇසින් තමයි නර්තනයේ සියලු වින්දනය ලබන්න පුළුවන්. ප්‍රේක්ෂකයා එකවිට ග්‍රහණය කරගෙන ඔහුගේ සියලුම ආකර්ෂණයන් රංගනය තුළ හිරකර තබා ගන්න පුළුවන් එවිටයි. ඒ නිසා බොහෝදෙනෙක් රූපවාහිනී තිරය හරහා බලලා පූර්ණ නිගමනවලට එනවා. ඒ නිගමන හරි හෝ වැරදි වෙන්න පුළුවන්. ඒ නිගමනය කුමක් වුවත් එයින් ගන්න තියෙන්නේ මම කිව්ව සියයට දහයේ ප්‍රතිශතය පමණයි.

**** නර්තන කණ්ඩායමේ ඇඳුම් නිර්මාණයන් විවිධ ඉරියව්වල හැඩතල මේවා ඔබ උකහා ගත් දේවල් වගෙයි පෙනෙන්නේ ?***

අපේ පන්සල් චිත්‍ර බිතු සිතුවම්වල පැරණි රජ බිසවුන්ගේ මූර්තිවල දක්නට ලැබෙන ඇඳුම් මෝස්තරයන් බොහෝමයක් මගේ නර්තන ශිල්පීන්ගේ දක්නට ලැබෙනවා. ඒ වගේම ඒ විවිධ ඉරියව් රංගනයට යොදාගෙන තියෙනවා. බොහෝ විට නර්තනයන් අවසන් වන්නෙ ඒ ඉරියව් වලින්.

**** ඔබ ගොඩ නැගූ නව ශෛලීන් ජනප්‍රිය වනවිට අපේ පැරණි සාම්ප්‍රදායික නැටුම් කලාව භාවිතයෙන් ඉවත් වෙයිනේ?***

එහෙම වෙන්න පුළුවන්. එය මම නරක දෙය්ක හැටියට දකිනවා. මගේ සෑම ප්‍රසංගයකටම මම සාම්ප්‍රදායික නර්තනයන් ඉදිරිපත් කරනවා. මෙරටට වඩා පිටරට වලදී ඒවාට වැඩි ඉල්ලුමක් තියෙනවා. කොහොමත් ඒවා ගිලිහෙන්න ඉඩ දෙන්නෙ නැහැ. මේ හැම නර්තනයකම ආත්මය කොට ගත්තේ අපේ සාම්ප්‍රදායික නැටුම් ශිල්පය. ඒක මම කවදාවත් අමතක කරන්නේ නැහැ.

**** ප්‍රවීණ නර්තන ශිල්පියෙක් හැටියට ඔබේ අත්දැකීම් තුළින් අලුතින් මේ ක්ෂේත්‍රයට එන අයට මොනවද කියන්න තියෙන්නේ ?***

මේ නර්තන කලාව ඉතාම විශිෂ්ඨ දෙයක්. ලෝකයේ ඕනෑම තැනක පිළිගන්නා අපේ සාම්ප්‍රදායික නැටුම් ටික හරියට ඉගෙන ගන්න. එහෙම ඉගෙන ගෙන තවත් අයට උගන්වන්න. මම -නාද" නමින් නර්තන ප්‍රසංගයක් ඉදිරිපත් කළා. එහිදී ඉදිරිපත් කළේත් අපේ සාම්ප්‍රදායික නැටුම් කලාව. මේ හැම දෙයක් ගැනම නිවැරදිව කලාත්මක විදියට හිතන්න. ඒ අනුව තමන් අලුත් ශෛලියක් ගොඩනගා ගන්න. මම දන්නවා අපේ රටේ බොහෝ ප්‍රවීණ නර්තන ශිල්පීන් පවා මගේ ශෛලිය අනුකරණය කරනවා. කමක් නැහැ. නමුත් මෙය තමාගේ ශෛලිය කියලා අනන්‍යතාවයක් ගොඩනගා ගන්න උත්සාහ කරන්න. ඒක තමයි මට දෙන්න තියෙන පණිවිඩය අපේ නව පරපුරට.

සාකච්ඡා කළේ - **පණ්ඩුක සමරසේකර**